11 ශ්‍රේණිය

# තෙවන ඒකකය
# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
# Information & Communication Technology

I කොටස

1. අන්තර්ජාලයට සහ ලෝක විසිරි වියමනට (WWW) අදාළ ව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද? (2016)
   1) අන්තර්ජාලය ලෝක විසිරි වියමනෙහි සේවාවකි.
   2) අන්තර්ජාලය සහ ලෝක විසිරි වියමන යන දෙකෙන් ම අදහස් වන්නේ එකකි.
   3) ලෝක විසිරි වියමන අන්තර්ජාලයෙහි සේවාවකි.
   4) අන්තර්ජාලය සහ ලෝක විසිරි වියමන අතර සම්බන්ධතාවයක් නොමැත.

2. වෙබ් අඩවියක් නැංවීම (Hosting) සඳහා අත්‍යාවශ්‍ය නොවන්නේ පහත සඳහන් කවරක් ද? (2016)
   1) වෙබ් අතරික්සුව (Web browser)
   2) වෙබ් සේවාදායකය (Web server)
   3) IP ලිපිනය
   4) වෙබ් අඩවියේ අන්තර්ගතය (Content)


3. http://www.bbc.com/sport/cricket යන ඒකාකාරී සම්පත් නිශ්චායකයෙහි (URL) වසම් නාමය (Domain name) පහත කුමක් මගින් දැක්වේ ද? (2016)
   1) bbc.com/sport
   2) bbc.com/sport/cricket
   3) http://www.bbc.com
   4) bbc.com

4. තම මිතුරකුට විද්‍යුත් තැපෑලක් යතුරුලියනය කරමින් සිටිය දී සිදු වූ අත්වැරැද්දකින් රාජන් අතින් විද්‍යුත් තැපැල් යෙදුම වැසී ගියේය. තමාගේ අවසන් නොකරන ලද විද්‍යුත් තැපෑල ඔහු සොයාගත යුතු වන්නේ කුමන ෆෝල්ඩරයෙන් ද? (2016)
   1) Draft 2) Inbox 3) Sent 4) Trash

5. "http://www.doenets.lk/exam/" යන URL එක සලකා බලන්න. මෙහි "doenets.lk" යනු, (2017)
   1) වසම් නාමය (Domain name) වේ.
   2) අධි පාඨ තැන්මාරු නියමාවලිය (Hypertext Transfer Protocol) වේ.
   3) අදාළ සම්පත් ද්‍රව්‍ය ඇති ස්ථානයේ පථය වේ.
   4) සම්පත් ද්‍රව්‍ය (Resource) වේ.

6. අදාළ URL එක නොදන්නා විට, වෙබ් අඩවියක ඇති තොරතුරක් සොයාගැනීමට පහත සඳහන් කුමක් භාවිත කළ හැකි ද? (2017)
   1) සෙවුම් යන්ත්‍රය (Search engine)
   2) ගොනු තැන්මාරු නියමාවලිය (FTP)
   3) විද්‍යුත් තැපැල් සේවාදායකය (Email server)
   4) වසම් නාම සේවාදායකය (DNS)

7. අජිත් සහ තිදෙනකුට යවන ලද විද්‍යුත් තැපැල් ලිපියක පහත පෙන්වා ඇති කොටස සලකා බලන්න. ඉහත පෙන්වා ඇති පරිදි තැපැල් ලිපියක් ඔබ ajith@doe.lk වෙත යැවුයේ නම්, මෙම ලිපිය ලැබී ඇතැයි අජිත්ට දැකගත හැකි වන අයවලුන් වන්නේ කවුරුන් ද? (2017)




   1) ajith@doe.lk පමණි.
   2) ajith@doe.lk , rizvi@nie.lk සහ kumar@school.net පමණි.
   3) ajith@doe.lk , rizvi@nie.lk , kumar@school.net සහ frank@nie.lk පමණි.
   4) ajith@doe.lk සහ frank@nie.lk පමණි.

8. 172.217.27.4 යන IP ලිපිනයෙහි www.google.com වෙබ් අඩවිය පවතින්නේ නම් google අඩවියේ IP ලිපිනය සොයාගැනීම සඳහා වෙබ් අතරික්සුව මගින් HTTP ඉල්ලීම (Request) යැවීම සඳහා පහත සඳහන් කුමක් භාවිත කරයි ද? (2018)
   1) DNS සේවාදායකය
   2) වසම් සේවාදායකය (Domain server)
   3) තැපැල් සේවාදායකය (Mail server)
   4) වෙබ් සේවාදායකය (Web server)

9. පුද්ගලයකුට 200MB ගොනුවක් අන්තර්ජාලය හරහා තවත් පුද්ගලයකුට යැවිය යුතුව ඇත. මේ සඳහා යෝග්‍ය වන්නේ පහත දක්වා ඇති කවර ක්‍රම ද? (2018)
   A - එය විද්‍යුත් තැපැල් (E-mail) ලිපියකට අමුණා යැවීම.
   B - ගොනුව යැවීමට FTP සේවාව භාවිතය
   C - Google drive වැනි මාර්ගගත ආචයන ධාවකයක් (Online storage drive) භාවිත කර අදාළ සම්බන්ධකය (Link) යැවීම.
   1) A හා B පමණි
   2) A හා C පමණි
   3) B හා C පමණි
   4) A, B හා C සියල්ල ම

ICT Tutorials HUB

10. ලෝක විසිරි වියමන (WWW) හි පවතින සෑම වෙබ් පිටුවක් සඳහා ම අනන්‍ය වූ හඳුන්වනය (Identifier) වන්නේ (2019)
1) විද්‍යුත් තැපැල් ලිපියනයයි.
2) අධිසන්ධානයයි (Hyperlink)
3) IP ලිපිනයයි.
4) ඒකාකාර සම්පත් නිශ්චායකයයි (URL)

11. පහත සඳහන් කුමන සංයෝජනයක අන්තර්ජාලය සම්බන්ධ නියමාවලි පමණක් අඩංගු වේ ද? (2019)
1) FTP, HTML, HTTP, SMTP
2) FTP, HTML, HTTP, TCP/IP
3) FTP, HTTP, SMTP, TCP/IP
4) HTML, SMTP, TCP/IP, URL

12. පහත සඳහන් කුමන සංයෝජනයක අන්තර්ජාල සේවා පමණක් නිරූපණය කරනු ලබයි ද? (2019)
1) විද්‍යුත් තැපෑල, ගොනු හවුලේ බෙදාගැනීම (File sharing), දුරස්ථ ප්‍රවේශය, අඛණ්ඩ මාධ්‍ය ප්‍රවාහනය (Streaming of media)
2) විද්‍යුත් තැපෑල, ගොනු හවුලේ බෙදාගැනීම, අඛණ්ඩ මාධ්‍ය ප්‍රවාහනය, වෙබ් අතරික්සු
3) ගොනු හවුලේ බෙදාගැනීම, HTML කේත, දුරස්ථ ප්‍රවේශය, සෙවුම් යන්ත්‍ර
4) දුරස්ථ ප්‍රවේශය, සෙවුම් යන්ත්‍ර, අඛණ්ඩ මාධ්‍ය ප්‍රවාහනය, වෙබ් අතරික්සු

13. පහත සඳහන් කුමන වගන්ති නිවැරදි වන්නේ ද? (2020)
A - අදාළ URL නොදන්නා විට, ලෝක විසිරි වියමනෙහි (WWW) තොරතුරු සෙවීම සඳහා සෙවුම් යන්ත්‍ර භාවිත කරනු ලැබේ.
B - තැපැල් සේවාදායක අතර පණිවුඩ හුවමාරුව සඳහා SMTP භාවිත කෙරේ.
C - වෙබ් සේවාදායකය මගින් වසම් නාම, IP ලිපින බවට පරිවර්තනය කරනු ලැබේ.
1) A හා B පමණි.
2) A හා C පමණි.
3) B හා C පමණි.
4) A, B හා C සියල්ලම


14. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අසත්‍ය වන්නේ කුමක් ද? (2020)
1) අන්තර්ජාලය යනු පරිගණක ජාලවල ජාලයකි.
2) අන්තර්ජාලය මගින් ප්‍රවේශ විය හැකි HTML ලේඛනයකට වෙබ් පිටුවක් යයි කියනු ලැබේ.
3) වෙබ් පිටුවක බහුමාධ්‍ය අන්තර්ගතයන් අඩංගු විය හැකි ය.
4) අන්තර්ජාලය හා WWW යනු එකම දෙයකි.

15. පහත සඳහන් කවරක් විද්‍යුත් තැපැල් ලිපිනයක නිවැරදි ආකාරය වන්නේ ද? (2020)
1) nuwan.senevi.gmail.com
2) nuwan2.senevi@gmail.com
3) nuwansenevi@gmail_com
4) nuwan@senevi@gmail.com

16. පහත සඳහන් දෑ අතුරින් කුමක් අන්තර්ජාල නියමාවලි (IP) ලිපිනයක් සඳහා නිවැරදි උදාහරණයක් වන්නේ ද? (2021)
1) 172.64.85
2) 172.64.85.24
3) 192.214.78.80.1
4) 192.214.78.256

17. විද්‍යුත් තැපැල් පද්ධතියක මෑත පණිවිඩ ආවයනය කිරීම සඳහා සාමාන්‍යයෙන් භාවිත කරනු ලබන ෆෝල්ඩරය වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද? (2021)
1) Draft
2) Inbox
3) Spam
4) Trash

18. පහත පෙන්වා ඇති URL එක සලකා බලන්න. (2021)




පහත දක්වා ඇති කුමක් මගින් ඉහත URL හි A,B සහ C කොටස් නිවැරදිව දක්වා තිබේ ද?
1) A – වසම් නාමය, B – නියමාවලිය ,C -ඉහළ මට්ටමේ වසම
2) A – වසම් නාමය, B – ඉහළ මට්ටමේ වසම, C - නියමාවලිය
3) A – නියමාවලිය, B – වසම් නාමය, C - ඉහළ මට්ටමේ වසම
4) A – නියමාවලිය, B – ඉහළ මට්ටමේ වසම, C - වසම් නාමය

19. පහත සඳහන් කුමන සංයෝජනයක් මගින් අන්තර්ජාල සේවාවක් සහ එයට අදාළ වූ නියමාවලිය (Protocol) නිවැරදිව පෙන්වනු ලබන්නේ ද? (2021)
1) Email, SMTP
2) WWW, FTP
3) Email, FTP
4) File Transfer, SMTP

20. IP ලිපිනයක් සඳහා නිවැරදි උදාහරණයක් වන්නේ පහත කවරක් ද? (2022)
1) 255.64.80
2) 170.63.80.23
3) 170.248.16.31.56
4) 192.248.16.300

ICT tutorials HUB

21. වසම් නාම (domain names), IP ලිපිනවලට පරිවර්තනය කරන්නේ පහත කවරක් ද? (2022)

1) DNS සේවාදායකය (DNS server)
2) තැපැල් සේවාදායකය (mail server)
3) මාධ්‍ය සේවාදායකය (media server)
4) වෙබ් සේවාදායකය (web server)

22. ඇමරිකාවේ සහ ජපානයේ සිටින නිලධාරීන් හා සමග පැවැත්වෙන වීඩියෝ සම්මන්ත්‍රණයකට (video conference) සම්බන්ධ වීමට ලංකාවේ සිටින නිලධාරියකුට අත්‍යවශ්‍ය නොවන්නේ පහත කුමක් ද? (2022)

1) කැමරාවක්, මයික්‍රොෆෝනයක් හා ස්පීකරයක් සහිත පරිගණකයක් හෝ ඊට සමාන උපකරණයක්
2) අන්තර්ජාල සම්බන්ධතාවයක්
3) අදාළ වීඩියෝ සම්මන්ත්‍රණ මෘදුකාංගය
4) USB ධාවකයක්

23. රාජා තම සුදුසුකම් ලේඛනය (resume) ඇමුණුමක් ලෙස එක් කර abcCompany@gmail.com වෙත ඊ-ලිපියක් යැවීමට අදහස් කරයි. සුදුසුකම් ලේඛනය ඈඳීමට ඊ-ලිපින යෙදුමේ පහත කවර තෝරාගැනීම රාජා භාවිත කළ යුතු ද? (2022)

(1) To (2) Subject (3)  (4) 

ICT Tutorials HUB